වළාකුල තුළ මුළා නොවූ දහවලේ හිරු දැකීම නුඹලාට අපහසු වන්නේ ද? ඔවුහු: නැත යැයි පැවසුවෝය. වළාකුල තුළ මුළා නොව් පුර පසළොස්වක සඳ දැකීම නුඹලාට අපහසු වන්නේ ද?

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අපි අපගේ පරමාධිපතිව අපි දකින්නෙමු ද?” යැයි විමසුවෝය. ඔහු “වළාකුල තුළ මුළා නොවූ දහවලේ හිරු දැකීම නුඹලාට අපහසු වන්නේ ද?” යැයි විමසීය. ඔවුහු: නැත යැයි පැවසුවෝය. වළාකුල තුළ මුළා නොවූ පුර පසළොස්වක සඳ දැකීම නුඹලාට අපහසු වන්නේ ද? යැයි විමසීය. ඔවුහු නැත යැයි පැවසුවෝය. ඔහු: “මාගේ ආත්මය කවුරුන් සන්තකයේ ඇත්තේ ද ඔහුමත දිවුරා පවසමි. නුඹලා ඒ දෙකින් එකක් දැකීමෙහි නුඹලා අපහසුතාවයට පත් නොවනවාක් මෙන්ම නුඹලාගේ පරමාධිපතිව දැකීමෙහි නුඹලා අපහසුතාවයට පත් නොවනු ඇත.” ඔහු තවදුරටත් මෙසේ පවසයි: ඉතින් මම නුඹව ගරුත්වයට පත් නොකළෙම් ද ප්රධානීන් බවට පත් නොකළෙම් ද ඔබව විවාහ කර නොදුන්නෙම් ද අශ්වයින් හා ඔටුවන් නුඹට වසඟ කර නොදුන්නෙම් ද හිස ඔසවා කටයුතු කරන්නටත් සතුටින් වාඩිවන්නටත් මම නුඹව අත් නොහැරියෙම් ද? යැයි විමසයි. එවිට ඔහු: එසේය යැයි පවසයි. අල්ලාහ් : ‘සැබැවින්ම නුඹ මා හමුවීම ගැන සිතුවෙහි ද?’ යැයි විමසයි. ඔහු ‘නැතැ’යි පිළිතුරු දෙයි. ‘එසේ නම් නුඹ මා අමතක කළාක් මෙන්ම මම නුඹව අමතක කරමි.’ යැයි පවසයි. පසුව දෙවැන්නා හමුවී මෙසේ පවසයි. “ඉතින් මම නුඹව ගරුත්වයට පත් නොකළෙම් ද ප්රධානීන් බවට පත් නොකළෙම් ද ඔබව විවාහ කර නොදුන්නෙම් ද අශ්වයින් හා ඔටුවන් නුඹට වසඟ කර නොදුන්නෙම් ද හිස ඔසවා කටයුතු කරන්නටත් සතුටින් වාඩිවන්නටත් මම නුඹව අත් නොහැරියෙම් ද?” යැයි විමසයි. ඔහු “එසේය” යැයි පවසයි. එවිට ඔහු ‘සැබැවින්ම නුඹ මා මුණ ගැසෙනු ඇතැයි සිතුවාද?” යැයි විමසයි. ඔහු “නැතැ”යි පිළිතුරු දෙයි. ඔහු: එසේ නම් නුඹ මා අමතක කළාක් මෙන්ම මම නුඹව අමතක කරමි. යැයි පවසයි. පසුව තුන්වැන්නා මුණ ගැසෙයි. ඒ ආකාරයෙන්ම ඔහුට පවසයි. එවිට ඔහු: “මාගේ පරමාධිපතියාණනි! මම ඔබව විශ්වාස කළෙමි. එමෙන්ම ඔබේ ධර්ම ග්රන්ථය, ඔබේ දූතවරුන් විශ්වාස කළෙමි. මම සලාතය ඉටු කළෙමි. උපවාසය රැක්කෙමි. දානමාන කටයුතු සිදු කළෙමි. එසේ ඔහුට හැකි පමණින් යහපත පවසා වර්ණනා කරයි. එවිට ඔහු: “එසේ නම් මෙහි සිටින්නේ ඇයි? විමසයි. පසුව ඔහුට “ඔබට එරෙහිව අපි සාක්ෂි දරන්නෙකු අපි අවදි කරන්නෙමු. යැයි පවසයි. ඔහු: “මට එරෙහිව සාක්ෂි දරන්නා කවුරුන්දැ?යි ඔහු තුළම සිතන්නට ගනී. එවිට ඔහුගේ කටට මුද්රා තබනු ලැබේ. ඔහුගේ කලව, ඔහුගේ මාංශ, හා ඔහුගේ
අස්ථිවලට “නුඹ කතා කරනු’ යැයි පවසනු ලැබේ. පසුව ඔහුගේ කලව ඔහුගේ මාංශ හා ඔහුගේ අස්ථි ඔහු ගැන දන්නා දෑ කතා කරයි. එසේ පවසා ඇත්තේ ඔහු නිදහසට කරුණු ඉදිරිපත් කරන බැවිණි. ඔහු කුහකයෙකි. එමෙන්ම අල්ලාහ්ගේ කෝපය ඔහු මත අත් වූ අයෙකි.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

ඇතැම් සහාබාවරු: අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අපි අපගේ පරමාධිපතිව දකින්නෙමු ද? යැයි විමසුවෝය. එවිට එතුමාණන් ඔවුනට: ‘වළාකුළ තුළ මුවා නොවූ එළිමහනේ හිරු දැකීම නුඹලාට අපහසු වන්නේද?” එනම් හිරු නුඹලාට දසුන් නොවන පරිදි එය ආවරණය කරන වළාකුළු නොමැති මුළු ලොවටම ආලෝකය විහිදු වන මධ්යහ්නේ ඉහළින් පිහිටන වේලාවේ හිරු දැකීම හේතුවෙන් ඔබ එකිනෙකා අතර ගැටලුවක් හෝ අපහසුතාවක් හෝ තදබදයක් හෝ නුඹලාට හට ගන්නේ ද? යැයි විමසුවෝය. එවිට ඔවුහු: “නැත” යැයි පිළිතුරු දුන්නෝය.